# GLOBAL ACADEMIC RESEARCH INSTITUTE

COLOMBO, SRI LANKA

## GARI International Journal of Multidisciplinary Research

ISSN 2659-2193

**Volume: 07 | Issue: 04**

On 31st December 2021

http://www.research.lk



Author: C.M.R.P. Chandrasekara

University of Kelaniya, Sri Lanka



GARI Publisher | Performing Arts | Volume: 07 | Issue: 04

Article ID: IN/GARI/ICMDVPA/2021/108 | Pages: 267-275 (08)

ISSN 2659-2193 | Edit: GARI Editorial Team

Received: 27.08.2021 | Publish: 31.12.2021

# ඌවේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාව පිළිබඳ අධ්‍යයනයක්

**සී. ඇම්. ආර්. පී චන්ද්‍රසේකර**

**සහය කථිකාචාර්ය**

**ලලිත කලා අධ්‍යයනාංශය**

**කැලණිය විශ්වවිද්‍යාලය**

ramithpreshal04@gmail.com

ශ්‍රී ලංකාවේ උඩැක්කි වාදන කලාව මහනුවර, උතුරු මැද, සබරගමුව, ඌව හා දකුණ යන ප්‍රදේශයන්හි ව්‍යාප්තව ඇත. තත් ප්‍රදේශයන්හි පැවැත්වෙන ආගමික හා ශාන්තිකර්ම අවස්ථා උදෙසා මෙම වාද්‍ය භාණ්ඩය යොදා ගැනේ. මහනුවර, උතුරු මැද, සබරගමුව හා දකුණ යන ප්‍රදේශයන්හි ව්‍යාප්ත උඩැක්කි, ඩැක්කි වාදන කලාව පිළිබඳ පර්යේෂණ සිදු වී පැවතිය ද ඌව ප්‍රදේශයේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාව පිළිබඳ වෙනත් පර්යේෂණ සිදු වී නොමැති බවට තොරතුරු අධ්‍යයනයේ දී දක්නට ලැබුණි. එම හේතුවෙන් ඌව ප්‍රදේශයේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ පවතින සුවිශේෂතා පිළිබඳ අප මෙහි දී අධ්‍යයනය කෙරේ. ඌව පළාතේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ පවතිනා සුවිශේෂතා හඳුනාගෙන ශ්‍රී ලාංකේය නර්තන වාදන ක්ෂේත්‍රයට නව දැනුමක් එක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. මෙම පර්යේෂණය මානව සංස්කෘතික විවරණයක් වන හෙයින් මානව වංශවේදී විධික්‍රමය යටතේ ගුණාත්මක දත්ත විශ්ලේෂණය යොදා ගන්නා ලදි. ප්‍රාථමික සාහිත්‍යය මූලාශ්‍රය, ද්විතික සාහිත්‍ය මූලාශ්‍රය, සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් මෙම පර්යේෂණය උදෙසා දත්ත රැස් කර ගන්නා ලද අතර එම දත්ත විශ්ලේෂණය මඟින් නිගමනයන්ට එළඹිණි. එහි දී ඌව ප්‍රදේශයේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ අන්තර්ගත උපත් කතා සාහිත්‍යය, තාල පද්ධතිය හා ඩැක්කියේ ප්‍රමාණය අනෙකුත් ප්‍රදේශයන්හි භාවිත ඩැක්කි, උඩැක්කි වාදන කලාවට වඩා වෙනස් වන බව දක්නට ලැබුණි. ඒ අනුව ඌව ප්‍රදේශයේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාව අනෙක් ප්‍රදේශයන්ට සාපේක්ෂව සුවිශේෂ වන බව මෙම අධ්‍යයනයේ අවසන් නිගමනය වශයෙන් දැක්විය හැකි ය.

**ප්‍රමුඛ පද** - උඩැක්කිය, ඩැක්කිය, ඌව, වාදනය, සබරගමුව

## හැඳින්වීම

වර්තමාන ශ්‍රී ලංකාවේ උඩරට, පහතරට හා සබරගමු වශයෙන් නර්තන සම්ප්‍රදායන් ත්‍රයක් ව්‍යාප්ත ව ඇත. මෙම නර්තන සම්ප්‍රදායන් ත්‍රය අතරින් සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් නර්තන ශෛලීන් සතරකි. රත්නපුර, කලවාන, බළන්ගොඩ හා ඌව එම නර්තන ශෛලීන් සතර වේ. මෙම නර්තන ශෛලීන්හි ප්‍රධාන අවනද්ධ භාණ්ඩය දවුල වන අතර අවශේෂ වාද්‍ය භාණ්ඩයක් ලෙස ඩැක්කිය ද භාවිත වනු දක්නට ඇත. මෙම ඩැක්කි වාදන කලාව සබරගමු නර්තන සම්ප්‍රදායට අයත් කලවාන, බළන්ගොඩ හා ඌව යන ශෛලීන්හි ව්‍යාප්ත ව පවතී. උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්හි ද මෙම වාද්‍ය භාණ්ඩය භාවිත වන අතර එම සම්ප්‍රදායන්හි මෙම වාද්‍ය භාණ්ඩය උඩැක්කිය ලෙස හැඳින්වේ. අප මෙම අධ්‍යයනයේ දී ලක්දිව නර්තන සම්ප්‍රදායන්හි ව්‍යාප්ත ඩැක්කි, උඩැක්කි වාදන කලාවන් අතරින් ඌවේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ පවත්නා විශේෂතා පිළිබඳ අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වේ. අනෙක් නර්තන සම්ප්‍රදායන් හා ශෛලීන්ට සාපේක්ෂව ඌව පළාතේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවෙහි සුවිශේෂතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ දී සිදු වේ. ඌව පළාතේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ පවත්නා සුවිශේෂතා හඳුනා ගෙන ශ්‍රී ලාංකීය නර්තන වාදන ක්ෂේත්‍රයට නවමු වූ දැනුමක් එක් කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන අතර මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී උඩරට, පහතරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන්හි වෙසෙන පාරම්පරික නර්තන ශිල්පීහු සතු ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය මඟින් හා ද්විතික සාහිත්‍ය මූලාශ්‍රය මඟින් දත්ත රැස් කර ගන්නා ලදි. මීට අමතරව සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ මඟින් ද දත්ත රැස් කර ගන්නා ලදි.

## පර්යේෂණ ක්‍රමවේදය

මෙම පර්යේෂණ දේශීය සංස්කෘතික ලක්ෂණ ප්‍රකට කෙරෙන මනාවවංශ විධි විවරණයක් වන හෙයින් දත්ත විශ්ලේෂණ ගුණාත්මක පර්යේෂණ විධික්‍රම යටතේ සිදු කරන ලද අතර උද්ගාමී තර්කන ඔස්සේ නිගමනයන්ට එළඹිණි. මෙම පර්යේෂණ උදෙසා ප්‍රාථමික හා ද්විතීක සාහිත්‍ය මූලාශ්‍රය සම්මුඛ සාකච්ඡා හා නිරීක්ෂණ යන ක්‍රම මඟින් ද දත්ත රැස් කර ගන්නා ලදි. ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය අධයානයේ දී බිබිල මල්ලැහැවේ පදිංචි ඩී. ඇම් ජයතිලක මහතා සතු ඩැක්කි උපත නම් වූ පද්‍යාවලිය ද, බිබිල බුටාරාවේ පදිංචි ඒ. පී අබේසිංහ මහතා සතු ඩැක්කි උපත පද්‍යාවලිය ද, බණ්ඩාරවෙල හල්පේ පදිංචි සටැන්ලි පතිරණ මහතා සතු ඩැක්කි උපත පද්‍යාවලිය ද අධ්‍යයනය කරන ලදි. මීට අමතරව ද්විතීක මූලාශ්‍රය යටතේ පොත්පත්, සඟරා හා පර්යේෂණ වාර්තා මඟින් ද දත්ත රැස්කර ගත් අතර ඉහත දක්වන ලද පාරම්පරික නර්තන ශිල්පීන් සමඟ සිදු කරන ලද සම්මුඛ සාකච්ඡා මඟින් හා ශාන්තිකර්ම නිරීක්ෂණ මඟින් ද තොරතුරු රැස් කර ගන්නා ලදි.

## දත්ත විශ්ලේෂණය

උඩරට හා පහතරට නර්තන සම්ප්‍රදායන්හි මෙම වාද්‍ය භාණ්ඩය උඩැක්කිය යන නමින් හැඳින්වුව ද ඌව සබරගමු ප්‍රදේශයේ ඩැක්කිය හා උඩැක්කිය යන නාම දෙකෙන්ම මෙම වාද්‍ය භාණ්ඩය හඳුන්වනු දක්නට ඇත. උඩරට නර්තන සම්ප්‍රදායේ සූවිසි විවරණ පෙරහැර මංගල්ල අවස්ථා උදෙසා ද, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්හි, දේව ශාන්තිකර්ම අවස්ථාවන්හි යෙදෙන කෝල්මුර ගායනා උදෙසා ද, ඌව ප්‍රදේශයේ දේව ශාන්තිකර්ම, සූවිසි වන විවරණ හා සූනියම් යාගය සඳහා මෙම වාද්‍ය භාණ්ඩය භාවිතයට ගැනේ.



උඩැක්කි උපත් කතා සාහිත්‍යය, උඩැක්කියේ ප්‍රමාණයන් හා උඩැක්කි වාදනයන් ආශ්‍රිත භාවිත තාල පද්ධතිය යන උප මාතෘකා යටතේ මෙම දත්ත විශ්ලේෂණය සිදු කළෙමු. උඩරට නර්තන සම්ප්‍රදායට අයත් උඩැක්කි උපතේ උඩැක්කියේ උපත සිදු වූ ආකාරය පිළිබඳ මෙසේ විස්තර වේ:

සම්මතේ විත්ති ය
සුරදෙවි සමඟ ඇඳුරු ය
පෙරමේ උඩැක්කි ය
කව්ද දුන්නේ රඟට ඩැක්කි ය

දහසක් ඇසින් නෙ ක
බැළුවයි එසක් දෙවි නෙ ක
මුහුදෙන් වන් නිසැ ක
එදා දෙවියෝ දුන්නු ලද දෙ ක

දල ගජ මත්ත වා
දෙවියන් අතින් කප වා
ඇඳුරු වරු ලිය වා
පසෙක සිටියදි නළ කුමරු වා

රජ මඟුලට එදා
එක් වුණු දේව සමු දා
දල කුමරිඳු එදා
දුන්නු සන්නස් පැහැද පැහැදා[1]

මහ සම්මත නිරිඳුගේ රාජ්‍ය මංගල උත්සවය උදෙසා සක් දෙවිඳුන් විසින් මෙම උඩැක්කිය නම් වාද්‍ය භාණ්ඩය නිර්මාණ කළ බව මෙම පද්‍යාවලියේ සඳහන් වේ. පහතරට නර්තන සම්ප්‍රදායේ අන්තර්ගත උඩැක්කි උපත් කථාව ඉහත උපත් කතා පුවතට වඩා හාත්පස වෙනස් වේ. එම උපත් කතාවට අයත් සන්නය පහත දැක් වේඃ

සුගත් අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ
සරුවඥ රාජෝත්තමයාණන් වහන්සේ බඹ
උත්පැත්තියෙන් පටන් ගෙන මාතලිය දිව්‍ය පුත්‍රයා
දුන් රන් බෙරය ද උමයංගනාවෝ
වාසය කරන්නා වූ කුන්ට නම් තාලම ද විශවකර්ම
දිව්‍ය පුත්‍රයෝ දුන් රන් ගිගින් බණ්ඩිය ද දැරූ
දේව සුරේන්ද්‍රයෝ පන සරි කියතින් කපා
රන් විදුරෙන් ගැටිය ද විද කඳ කුමරුන්ටත් දුන්
කඳ ද රන් පටියෙන් වෙලා රන් කය
අත ගසා ගනේශ්වරයන් දුන් රන්
ඇස් දෙක ද සූර ගුරු දුන් උර චාමර මාලාව ද
මෙන් මේ ගැත්තමුරු අරක්ගත්තා වූ උඩැක්කිය ද වම් උරේ දරාගෙන
දකුණු ශ්‍රී හස්තයෙන් තත් දිත් තොං නම්
තකු දිකු පෙර කී නාද පවත්වමින්
සුගත් අප තිලෝගුරු සම්‍යක් සම්බුද්ධ
සරුවඥ රාජෝත්තමයාණන් වහන්සේට
සුභ මංගල්‍යය උදෙසා නොහොත් සුභ මංගලම්
ඝෝෂාවක් පැවැත් වූ සේක[2]

බුදුන් වහන්සේගේ බුද්ධ මංගල්‍යයට වාදනය කිරීම උදෙසා මාතලී දිව්‍ය පුත්‍රයා විසින් මෙම උඩැක්කිය නිර්මාණය කරන ලද බව ඉහත විස්තරයේ සඳහන් වේ. සබරගමු නර්තන සම්ප්‍රදායේ ඇතුළත් ඩැක්කි උපත් කතාව ඉහත කතා පුවත් දෙකට වඩා වෙනස් වන බව මෙම උපත් කතා සාහිත්‍යය විශ්ලේෂණයේ දී දක්නට ලැබේ. එම කතා පුවතට අයත් සන්නය පහත දැක්වේඃ

ජිනා තාලයේ උත්පැන්නා වූ ඒ රාෂ්ට්‍ර ගෝරාෂ්ට තීර්ගෝ
කඳ මැද විචිත්‍ර වූ මලි පසක් ද ගෑවූ ගැටිය ද හීරූ ගිගිරි
වළල්ල ද දිවා දුහුල් ලණුව ද නාථා තාලම්පට ද ඉන්ද්‍ර
චන්ද්‍ර සූර්ය විදු දේවතාවා පැන නැගී කල්හි තාන් නවයක්
සහිත උඩැක්කිය සාදා රාගම් දෙතිසක් කියා පද සැට
සතරක් වයා එදත් ඒ දිවකුරු මුනිදුට ගැසූ උඩැක්කි
මාලාව යුත්තේ වදනින්[3]

මෙම විස්තරයේ පූර්ණ දෙවියන් විසින් දිවකුරු බුදුන් වහන්සේට පූජෝපහාර පිණිස උඩැක්කිය වාදනය කළ බව සඳහන් ය. ඌව නර්තන ශෛලියේ ඇතුළත් ඩැක්කි උපත පහත දැක් වේඃ

> යනු කී හෙයින් කියන ලද පංච තූර්ය නාදයක් ඇත්තා වූ මේ ශ්‍රී ලංකා ද්වීපයට උපහාර වූ සක් දිවසින් බුද්ධ මංගල්‍යයකුත් පටන් ගත්තේ ය. ඒ බුද්ධ මංගල්‍යයේ දී නෙර්ත නැටුමද නාදයට පිඹීම් ද ඕසයට කීම ද තාලයට දවුල ද, ගීතයට ඩැක්කිය ද සිව් සැටක් තරඟ උපන්නේ ය. නර්තනයට නැටුම් මහා බ්‍රහ්මයා දුන්නේ ය. ඕසෙට කීම සරස්වතී දේවියෝ දුන්නේ ය. තාලයට දවුල විෂ්ණු දෙවියෝ දුන්නේ ය. එවිට මිහිකත පැන නැඟී පොළොව ගුගුරන්නට පටන් ගත්තේ ය. මේ පොර මධ්‍යයට මහා සම්මත රජින්ද්‍රෝ වැඩමවා එදා මිල්ලේ කපා කොටා තිබුණු තැනට විශ්ම කර්ම දිව්‍ය පුත්‍රයා ගෙන්වා එම මිල්ල කඳ පවිත්‍ර කොට ඔහුගේ වම් හස්තයෙන් සොල සාඟුලක් දිගට සහ පසඟුලක් කැටපත් මැන ලියවමින් කඳ සිරියල්ලා තට්ටු දෙක මවා දොළොස් පලකින් තට්ටු විද ලණු දමා තද කර මල් දඬු පසක් බිඳිමින් මහා සම්මත සම්දානන් අතර වැඩූ සේක. එවිට උන් වහන්සේ තෝ ගීතයත් කියන පර්වතයට පය ගසා වණී ගීතං කියන පදය එකගිල්ලෙන් නාද කල තැනේ දී අග නිෂ්ටා බ්‍රහ්ම ලෝකයේ පටන් ගිගුම් දී ඇසී ගියේ ය. තවද නොයෙක් රැස්ව සිටින මහ පෘථිවියට පය ගසා ''තාදී කුත දොං තා තා'' යන පදය පසඟිල්ලෙන් තද කළ තැනේ දී දස දහසක් සක්වල ගිගුම් දී ඇසුන හෙයින් එතැන් සිට මෙතැන් දක්වා ලිඛිත ගණිත සන අෂ්ඨ කර්ම අතත විතතබරත නෙර්ථ ගීතාදී නොයෙක් ප්‍රබන්ධයකට පළමු කොට විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා සාදා දුන් නෙර්ථ ගීතය ඩැක්කිය අදත් මේ රංග සභා මණ්ඩපයට රැගෙන ආ සේක.[4]

මෙම උපත් කතාවේ විශ්ව කර්ම දිව්‍ය පුත්‍රයා විසින් බුද්ධ මංගල්‍යය උදෙසා මෙම ඩැක්කිය නිර්මාණ කරන ලද බව සඳහන් වේ.

මෙලෙස එක් එක් නර්තන සම්ප්‍රදා, ශෛලීන්හි අන්තර්ගත උපත් කතා, සන්න ආදිය පිළිබඳ විමර්ශණයේ දී මෙම උපත් කතාවත්හි සමානතා මෙන්ම විෂමතා ද පවතිනු දක්නට ඇත. පොදුවේ මෙම උපත් කතා අතර පවත්නා සමානතා ලෙස මෙම වාද්‍ය භාණ්ඩ නිර්මාණයේ දී ප්‍රභල චරිතයක් මූලික වීම වැදගත් සිදුවීමක් එයට සම්බන්ධවීම දක්නට ලැබේ. තව ද මෙම උපත් කතා රචනා වීමේ දී බෞද්ධ හා හින්දු සාහිත්‍යය ද මූලාශ්‍රය වී ඇත. එම සාහිත්‍ය මෙම උපත් කතාවන්ට එක් වීමෙන් මෙම උපත් කතාවන්හි පවත්නා සාඩම්බර සම්ප්‍රදාය ඉස්මතු වී ඇත. තවද මෙම උපත් කතා සංසන්දනයේ දී ඌව නර්තන ශෛලියේ ඇතුළත් උපත් කතා සාහිත්‍යය අනෙක් නර්තන සම්ප්‍රදායන්ට වඩා වෙනස් බව දක්නට ඇත.

මීළඟට අප විවිධ ප්‍රදේශයන්හි භාවිත ඩැක්කි හා උඩැක්කි අතර පවත්නා ප්‍රමාණ පිළිබඳ අධ්‍යයනය කෙරේ. උඩරට නර්තන සම්ප්‍රදායේ භාවිතයට ගැනෙන උඩැක්කියේ ප්‍රමාණය පිළිබඳ උඩැක්කි උපතේ මෙසේ විස්තර වේ:

වියත් තුනඟුල් දිගින් සහ එහි මුදුන තුනඟුල් රැගත් ඩැක්කි ය
උගත් ඇඳුරන් කරපු යාගෙට ඉසුරු ගෙනදුන් දිවිය ඩැක්කි ය
රැගත් නළුවන් සර්ව හරනින් සෑදී වයමින් තාල ඩැක්කි ය
සටන් ලෙස ගී නාද සවිදන් තාල ගයමින් නැටුම් දැක්වි ය[5]

උඩරට නර්තන සම්ප්‍රදායේ භාවිත වන උඩැක්කියේ දිග ප්‍රමාණය වියතක් හා තුන ගුලක් වන අතර පළල තුන අගුලක් ලෙස සඳහන් වේ. සබරගමු නර්තන සම්ප්‍රදායේ භාවිත වන ඩැක්කියේ ප්‍රමාණය පිළිබඳ එම උපත් සාහිත්‍යයේ මෙසේ විස්තර වේ:

එදාම අලුයම මිල්ල කපා ලා
එදාම ඒ කඳ ගෙන දිග මැනලා
සය අඟුලක් දිග ගෙන මැනලා
තුන් අඟුලකට කටසාදති මැනලා[6]

මෙම පද්‍යයේ සබරගමු ප්‍රදේශයේ භාවිත වන ඩැක්කි කඳ දිග අඟුල් සයක් සහ පළල අඟුල් තුනක් බව සඳහන් වේ. ඒ අනුව උඩරට නර්තන සම්ප්‍රදායේ සහ සබරගමු නර්තන සම්ප්‍රදායේ භාවිත වන උඩැක්කියේ ප්‍රමාණ අතර විෂමතා පවතින බව පැහැදිලි ය. ඌව පළාතේ භාවිතයට ගැනෙන ඩැක්කියේ ප්‍රමාණය ඉහත දැක් වූ ප්‍රමාණයන්ට වඩා වෙනස් ය. තත් ප්‍රදේශයේ භාවිත උඩැක්කිය එක් වියතක් හා අඟුල් දෙකක ප්‍රමාණයකින් යුතු බව උපත් කතා පිළිබඳ විස්තර ඇතුළත් පද්‍යාවලියේ සඳහන් වේ:

එක් වියතක් දෑඟුලකුත් දැග ලා
එක් බඩ අතකුත් ලණුව සදා ලා
දොළොස් පොලක් තට්ටුව විද අද ලා
තට්ටු දෙකක් විද මවා එපද ලා[7]

ඊහත පද්‍යයේ එක් වියතක් හා අඟුල් දෙකක දිගින් යුතුව ඩැක්කිය සකසා ගත යුතු බව සඳහන් වේ. මෙම තොරතුරු පිළිබඳ සංසන්දනයේ දී ලක්දිව භාවිත ඩැක්කි හා උඩැක්කිය වාද්‍ය භාණ්ඩයන්හි ප්‍රාදේශීය වෙනස්කම් පවතින බව පැහැදිලි වේ.

මීළඟට අප අවධානය යොමු කරනුයේ මෙම සම්ප්‍රදා හා ශෛලීන්හි උඩැක්කි සඳහා භාවිතයට ගැනෙන තාල පද්ධතිය පිළිබඳව ය. උඩරට, සබරගමු නර්තන සම්ප්‍රදායේ උඩැක්කි වාදනය දොන්ත පහ නම් වූ තාල පහ මත ගොඩ නැගී ඇත. උඩරට නර්තන සම්ප්‍රදායේ ඇතුළත් දොන්ත පහ හෙවත් තාල පහ පහත දැක් වේ:

දොං ජිජි ගත (3x3)

දොං ජිජි තකට දොංතක (3x4)

දොං දොං ජිං ජිං ගජිංගත (2x4)

දොං ජිංත ගත දොංත (2x3)

දොම් කිත කිත දොං (4x4) [8]

මෙම දොංත පහේ පළමු තාලය මාත්‍රා තුනෙන් තුනටත්, දෙවන තාලය මාත්‍රා තුන හතරටත්, තෙවන තාලය මාත්‍රා දෙක හතරටත්, හතරවන තාලය මාත්‍රා දෙක තුනටත්, අවසාන තාලය මාත්‍රා සතරටත් යෙදේ. සබරගමු නර්තන සම්ප්‍රදායේ භාවිත වන දොංත පහ පහත දැක් වේ:

දොංත තක්කිට (3x4)

දොං දොං දොමිත (2x2x3)

දොං දොං තක ජිංතක (2x2x2x4)

ජිං කිට ජිං කිට කිට තක්කිට කිටතක (2x3x4)

දොංත තකට[9] (3x3)

සබරගමු නර්තන සම්ප්‍රදායේ ඇතුළත් දොංත පහේ පළමු තිත් රූපය මාත්‍රා තුන හතර තාලයට ද, දෙවන තාලය මාත්‍රා දෙසුළු මැදුම් තුන් තිතට ද, තෙවන තාලය තුන්සුළු මහ සිව් තිතට ද, හතරවන තාලය සුළු මැදුම් මහ තුන් තිතට ද, පස්වන තාලය මාත්‍රා තුනෙන් තුනට ද යෙදේ. උඩරට හා සබරගමු නර්තන සම්ප්‍රදායේ ඇතුළත් උඩැක්කි වාදනයේ මූලික තිත් රූප පසක් මත ගොඩ නැගී පවතින බව ඉහත උදාහරණ මඟින් පැහැදිලි කර ගත හැකි ය.

ඌව නර්තන ශෛලියේ ව්‍යාප්ත ඩැක්කි වාදන කලාවේ භාවිත තාල පද්ධතිය ඉහත තාල පද්ධතියට වඩා වෙනස් වන බව මෙම තාල සංසන්දනයේ දී දක්නට ලැබේ. ඌවේ භාවිත තාල පද්ධතිය තාල සතක් මත ගොඩනැගී ඇත. එම තාල සත පහත දැක් වේ.

එක් තාලය (4x4)

දෙ තාලය (2x3)

තුන් තාලය (3x3)

සතරවන තාලය (3x4)

පස්වන තාලය (2x2x2x3)

සයවන තාලය (2x2x2x4)

සත්වන තාලය (2x2x2x4x4) [10]

මෙම තාල පද්ධතියේ එක් තාලය මාත්‍රා හතරට ද, දෙ තාලය මාත්‍රා දෙක තුන මත ද, තුන් තාලය මාත්‍රා තුන මත ද, සතරවන තාලය මාත්‍රා තුන සතර මත ද, පස්වන තාලය තුන් සුළු මැදුම් සිව්තිත මත ද, හයවන තාලය තුන්සුළු මහ සිව්තිත මත ද, හත්වන තාලය තුන්සුළු දෙමහ පස්තිත මත ද ගොඩ නැගී ඇත. ඒ අනුව උඩරට හා සබරගමු යන නර්තන සම්ප්‍රදායන්ට වඩා සුවිශේෂ වූ තාල පද්ධකියක් ඌව නර්තන ශෛලියේ උඩැක්කි වාදනය හා බැඳී පවතින බව ඉහත සාධකය දෙස බැලීමේ දී පැහැදිලි වේ.

මෙම කරුණු අධ්‍යයනයේ දී ලක්දිව ව්‍යාප්ත ඩැක්කි, උඩැක්කි වාදන කලාවේ අන්තර්ගත උපත් කතා සාහිත්‍ය, උඩැක්කියේ ප්‍රමාණ හා තාල පද්ධති අතර විෂමතා පවතින බවත්, ඒ අතරින් ඌවේ භාවිත උඩැක්කි වාදන කලාවේ අනෙක් සම්ප්‍රදායන්හි දක්නට නොලැබෙන සුවිශේෂතා පවතින බවත් මෙම කරුණු අධ්‍යයනයේ දී තහවුරු වේ.

---

1 සේදරමන්. ජේ. ඊ, 2003. **උඩරට නැටුම් කලාව,** ඇම්. ඩී ගුණසේන සහ සමාගම, 37 පිටුව

2 ගාල්ලේ මනෝජ් මහතා සතු උඩැක්කි උපත ඇසුරින්

3 බළන්ගොඩ කුබල්මුල්ලේ පදිංචි කේ. ඇම් බණ්ඩාර මහතා සතු උඩැක්කි උපත ඇසුරින්

4 බණ්ඩාරවෙල හල්පේ පදිංචි ස්ටැන්ලි පතිරණ සතු උඩැක්කි උපත ඇසුරින්

5 සේදරමන්. ජේ. ඊ, 38 පිටුව

6 බළන්ගොඩ කුබල්මුල්ලේ පදිංචි කේ. ඇම් බණ්ඩාර මහතා සතු උඩැක්කි උපත ඇසුරින්

7 බණ්ඩාරවෙල හල්පේ පදිංචි ස්ටැන්ලි පතිරණ සතු උඩැක්කි උපත ඇසුරින්

8 තිත්තපජ්ජල වී. වයි සුරඹා මහතා සමඟ සිදු කළ සම්මුඛ සාකච්ඡා ඇසුරින්

9 i. බළන්ගොඩ කුමල්මුල්ලේ පදිංචි කේ. ඇම් බණ්ඩාර මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාව

ii. බුත්තල පදිංචි සමෝරිස් මහතා සමඟ කළ සම්මුඛ සාකච්ඡාව